# ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපන වැඩසටහනෙහි පූර්වසේවා ගුරුපුහුණුවක අවශ්‍යතාව පිළිබඳ අධ්‍යයනයක්.

අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා

ඉදිරිපත් කෙරෙන නිබන්ධනය

කොළඹ විශ්වවිද්‍යාලය.

UCLIB
403441
CR

රුක්මනී මංගලිකා ප්‍රේමරත්න.
M.Phil. 51.

අධ්‍යාපන පීඨය,

1986.

සංක්ෂේපයෙන් ......

ගැටළුව :- ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපන ඉතිහාසය විමසීමේදී, පෘතුගීසි යුගයේදී 'මොනස්ටරි' වලත්, ලන්දේසි යුගයේදී සෙමනේරිවලත්, බ්‍රිතාන්‍ය යුගයේදී නෝමල් පාසැලේදීත් ගුරු පුහුණුව ලබාදුන් බවට සාක්ෂි ඇත. මෙම ආයතනවලට දක්ෂ සිසුන් තෝරා ඔවුන්ට ගුරුපුහුණුව ලබාදී පත්වීම් දෙනු ලැබිණි. බ්‍රිතාන්‍ය යුගයේදී, ගුරු හිඟයට පිළියමක් ලෙස යොදා ගනු ලැබූ 'මොනිටර් ක්‍රමය' අනුව ගුරුසේවයට පිවිසියේ පුහුණුවක් නොලත් නවකයන්ය. එම යුගයේදීම 1903 පමණ වනවිට ගුරු විද්‍යාල ඇරඹී තිබූ අතර, 'මොනිටර්' වරුන්ටද, නවකයින්ටද ගුරුපුහුණුව ලබාදිනි. එකල පූර්වසේවා ගුරුපුහුණුවට බාධා පැමිණවූයේ මුදල් හිඟය හා ගුරු හිඟයයි. පූර්වසේවා පුහුණු වැඩසටහනක් ස්ථාපනය වූයේ නැත.

එදා මෙදා අතරතුර අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉමහත් පරිවර්තනයන් සිදුවී ඇත. අද අධ්‍යාපනය ක්‍රියාවලිය සංකීර්ණය. ගුරුවරයාගේ කාර්ය පුළුල්ය. භාරදූරය. අන් බොහෝ වෘත්තීන්හිදී මෙන්ම ගුරු වෘත්තියේදී ද, පූර්වසේවා පුහුණුවක අවශ්‍යතාව ලොව නන්දෙස පිළිගැනී ඇත. අද ජාතියක ජීවනාලිය බඳු, අනාගත පරපුර සඳහා නවලොවක් ගොඩනඟන්නන්ගේ කාර්ය ගුරුවරුන් වෙත පැවරී ඇත. වත්මන් පරපුරේ, දැනුම් කුසලතා ආකල්ප කෙරෙහි වත්මන් ගුරුවරයා සැළකිය යුතු බලපෑමක් කරයි. එබැවින් ගුරුවරුන් වෘත්තියෙහි න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික අංශයන්හිද මනා පුහුණුවක් ලත් අයවීම අතිශයින් වැදගත් වේ. බොහෝ සංවර්ධිත රටවල් පූර්වසේවා ගුරුපුහුණුව අත්‍යවශ්‍ය බව අවිවාදයෙන් පිළිගෙන එය ක්‍රියාත්මක කරයි. සංවර්ධනය වෙමින්

පවත්නා රටවල්ද එහි වැදගත් කම අවබෝධ කොටගෙන විවිධ අත්හදා බැලීම් කරයි. ශ්‍රී ලංකාවේ 1958 වනතෙක් අ.පො.ස(සා.පෙ) සහ අ.පො.ස (උ.පෙ) සමතුන් සඳහා වූ පූර්වසේවා ගුරුපුහුණුව අහෝසි විය. ක්‍රමයෙන් වැඩිවන අධ්‍යාපන ඉල්ලුමට සරිලන සේ නුපුහුණු ගුරුවරුන් පත්කිරීම ඇරඹිණි. 1966 ආරම්භ කරන ලදුව විශ්වවිද්‍යාලයන්හි පැවති අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව 1982 දී අත්හිටුවා ලීමෙන්, ඒ දක්වා පැවති එකම පූර්වසේවා ගුරු පුහුණු පාඨමාලාවද අහෝසි විය.

1981 ධවල පත්‍රිකාවෙන් පූර්වසේවා ගුරුපුහුණුව ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගෙන ඇත. ඒ සඳහා වැඩමාලාද සැළසුම් කොට දියත් කරනු ලැබුවේ මෑතකදීය. පූර්වසේවා ගුරුපුහුණුවෙහි අදාළබව හා එහි අත්‍යවශ්‍යතාව සනාථ කිරීම වඩාත් කාලෝචිත වේ.

## පර්යේෂණ අරමුණු:

1982 අ.පො.ස(උ.පෙ) සමතුන් අතරින් ගුරු සේවයට තේරුණු කෙටිකාලීන පූර්වසේවා පුහුණුවක් පමණක් ලැබ, ක්ෂේත්‍රයට පිවිසි නවක ගුරුවර ගුරුවරියන් 380 දෙනෙකුගේ අදහස් හා ගැටළු ඇසුරින් පූර්වසේවා පුහුණුවක අදාළත්වය අවශ්‍යතාව විමසීම ප්‍රධාන අරමුණ විය. ඉන් ගුරුවරුන්ගේ අවශ්‍යතා තත්සේරුවක් මගින් ගැටළුවේ ගැඹුරු අධ්‍යයනයකට මගපෑදෙනු ඇතැයි අපේක්ෂා කෙරිණි.

පෙරපුහුණුවක් නොලැබ ගුරු වෘත්තියට අවතීර්ණ වන නවකයාගේ ගැටළු කවරේද? ඒවාට විසඳුම් සෙවීමට ඔහු අපොහොසත් වන්නේ කෙසේද?

ඔවුන්ට අවශ්‍ය පුහුණුව ලබාදීමට දැනට පවතින බාධක කවරේද? යන්නද අධ්‍යයනයේ අරමුණ විය. ශ්‍රී ලංකාවේ වත්මන් ගුරු ශ්‍රමය තුළ පවත්නා පුහුණු නුපුහුණු විෂමතා, නුපුහුණු ගුරුවරුන් පුහුණු කිරීම සඳහා දියත් කෙරෙන වැඩ-සටහන්, අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමට ගතයුතු පියවර ගැඹුරු විමසුමට ලක් කිරීම මෙහි තවත් අරමුණු කිහිපයකි.

නුපුහුණු ගුරුවරයකු වත්මන් අධ්‍යාපන ක්‍රියා වලියට අනුවර්තනය වීමට අසමත් වේනම් ඔහුට පූර්ව පුහුණුවක් ලබාදීමේදී වැදගත් වන ගුරුවෘත්තියේ විවිධ අංශද අධ්‍යයන පර්යේෂණයේදී සැලකිල්ලට භාජනය විය.

ප්‍රතිඵල සැකෙවින්

පර්යේෂණයට තෝරාගනු ලැබූ නියැදිය, දින 7-10 ක් වැනි ඉතා කෙටිකාලයකට සීමාවූ පූර්වසේවා පුහුණුවක් ලත් අයවූහ. ගුරුපුහුණුව පිළිබඳව ඔවුන්තුළ යම් අවබෝධයක් විය. නමුත් ඔවුන් ලත් පුහුණුව අසම්පූර්ණය, යන හැඟීමද ඔවුන් තුළවිය. ක්ෂෙත්‍රයට පිවිසීමෙන් පසුව එය වඩාත් තහවුරු වූ බව ඔවුන් අළලා කරනු ලැබූ අන්වායාම පරීක්ෂණයෙන් හෙළිවිය. පාඩමක් සැලසුම් කිරීම, පාඩම් සටහන් ලිවීම, පාඩම ඉදිරිපත් කිරීම, පංති පොත භාවිතා කිරීම සහ ඉගැන්වීම් උපකරණ භාවිතය හා ඇගයීම යන මූලික අංශයන්හිදී පවා මෙම නවක ගුරුවරුන් වැඩිදෙනෙකු දැක්වූ දුර්වලතා ඉගැන්වීම් නිරීක්ෂණයේදී පැහැදිලි විය.

නවක ගුරු නියැදියට දෙනුලැබූ ප්‍රවිෂ්ඨ චයාසා පරීක්ෂණයේදී දැක්වූ ප්‍රතිචාර අනුව ගුරු වෘත්තියට ඉතා සැහැල්ලුවෙන් සැළකූ ඔවුහු පූර්වසේවා අවසානයේ

UNIVERSITY OF C... LIBRARY SRI LANKA

පැවති නිකුත්වීම් පරීක්ෂණයෙන් පැහැදිලි කළේ ගුරු වෘත්තිය බැරෑරුම් වගකීම් රැසකින් පිරි වෘත්තියක් ලෙස පිළිගත් බවයි. අන්වායාම පරීක්ෂණයෙන් අනාවරණය වූයේ ශෛශවයේදී ගැටලු රාශියකට ඔවුන් මැදිවූ බවත් ඒවාට විසඳුම් සෙවීමට අපොහොසත් වූ බවත්ය. නවක ගුරුවර ගුරුවරියන්ගේ අදහස් හා ගැටලු ඇසුරින් මෙන්ම පරිපාලකයන්, ඥානගස්ත ගුරුවරුන් හා පවත්වනලද සම්මුඛ සාකච්ඡාවලින්ද පූර්ව පරීක්ෂණ විමසුමෙන්ද ලොව නොයෙකුත් රටවල ගුරු අධ්‍යාපන ව්‍යුහයන් ක්‍රියාපිළිවෙත්, වැඩමාලා විමසුමෙන්ද, පැහැදිලි වූයේ ගුරුවරුන් පූර්වසේවා පුහුණුව ජාතියක අධ්‍යාපන ක්‍රියාවලියේ ශක්තිමත් පදනම බවයි.